ඇතැම් විටක පාඨක ආකර්ෂණය සඳහා හෝ වෙනත් එවැනි හේතුවක් සඳහා යොදනා ඇතැම් පුවත්පත් සිරස්තල සම්බන්ධයෙන් වරක් දෙවරක් නොව තෙවරක් සිතා බලන මෙන් එම මාධ්‍ය වෙත සිහිපත් කිරීමට ඇතැම් විටකදී පාඨක අපට සිදුවේ. එවැනි පුවත් වාර්තාවකට නිදසුනක් ලෙසින් දිවයින ඉරිදා සංග්‍රහයේ (08/08) "අර වගේ වැඩක් කරන්න ගිය කාමාතුරයාට රොනාල්ඩො ගණයේ පා පාරක්" යන සිරස්තලයෙන් යුතුව පළවූ වාර්තාව දැක්විය හැක. මේ සම්බන්ධයෙන් අපට නැගීමට ඇති ප්‍රශ්න පහත පරිදි පෙළගැස්විය හැක.

1) "අර වගේ වැඩක්" යනුවෙන් දක්වා ඇත්තේ ලිංගික අතවරයකට තැත් කිරීමක් යන්නද? එම භාෂා භාවිතය සහ සිරස්තල යෙදීම පිළිබඳව ඔබේ අදහස කුමක්ද?

2) භාවාතිෂය ආකාරයකින් මෙම වාර්තාව ඉදිරිපත් කෙරෙන්නේ, පාඨකයාව මෙම සිදුවීමත්, එයින් නිරූපණය වන යම් ආකාරයක සමාජ ගැටළුවත් සම්බන්ධයෙන් දැනුවත් කිරීමටද? එසේත් නැතිනම්, හුදු භාවාතිෂය කතාන්තරයක් පමණක් කියවීමටද?

මෙම වාර්තාව මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනය කරන්නේ යැයි ඔබ නොසිතන්නේද?

**#MediaEthicsSL #lka #sinhalanews #SundayDivaina**